# ආගමන සමයේ දෙවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 40: 1-5, 9-11

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

### සමිඳාණන් හට මාවතක් සූදානම් කරන්න.

"සනසන්න, මාගේ සෙනඟ සනසන්නැ" යි ඔබේ දෙවිඳාණෝ වදාරණ සේක. "කරුණාවෙන් ජෙරුසලම් වැසියන්ට කතා කරන්න. හඬ නගා ඔවුන්ට මෙසේ කියන්න: ඔවුන්ගේ වහල්කමේ කාලය දැන් ඉවර වී ඇත: පව්කමාව ඔවුන්ට ලැබී ඇත. සියලු පව්වලට අඩුවම දෙගුණය බැගින් සමිඳුන්ගේ හස්තයෙන් ම ඔවුන්ට ලැබී ඇත."

මෙසේ කියන හඬට සවන් දෙන්න. "වනාන්තරයේ සමිඳුන් හට මාවතක් එළි කරන්න. පාළුකරයේ අපේ දෙවිඳුන් හට මහ පාරක් සාදන්න.

සියලු මිටියාවත් පුරවනු ලබන්නේ ය. සියලු කඳු හෙල් කපා පහත් කරනු ලබන්නේ ය. සියලු හෙල් සමතලා කරනු ලබන්නේ ය: රළු තැන් සුමුදු කරනු ලබන්නේ ය:

සමිඳුන්ගේ තේජාලංකාරය එවිට එළිදරව් වන්නේ ය. සකල මිනිස් වර්ගයා එය නරඹන්නෝය. මෙසේ වදාළේ සමිඳාණෝ ම ය."

සියොන්ට සුභ ආරංචිය ගෙනෙන දූතයාණෙනි, උස් කන්දට නගින්න, සියොන්ට සුභ ආරංචිය දන්වන්න. ජෙරුසලෙමට සුභ ආරංචිය ගෙනෙන දූතයාණෙනි, හඬ නගා ප්‍රකාශ කරන්න: බිය නොවී උස් හඬින් "ඔබේ දෙවිඳාණෝ වඩින සේකැ"යි ජුදාහි නගරවලට ප්‍රකාශ කරන්න. මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ බලපරාක්‍රමයෙන් වඩින සේක. වික්‍රමයෙන් පාලනය කරන්න වඩින සේක. ත්‍යාග යන් එතුමාණෝ තමන් සමඟ ගෙන එන සේක. තම සෙනඟට විපාකයන් ප්‍රදානය කරන සේක.

එඬේරෙකු සේ එතුමාණෝ තම රැළ පෝෂණය කරන සේක. දෑතින් බැටළු පැටවුන් වඩාගෙන ළයෙහි උන් හොවාගෙන යන සේක: කිරි දෙන බැටළු දෙනුන්ට මඟ පෙන්වන සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 85: 8-13

පිළිතුර : සමිඳුනි, ඔබේ තිර පෙම අපට පෙන්වුව මැනව.

ගීය : දෙවි සමිඳුන් වදාරන වදනට සවන් දෙමි,
මන්ද, සිය සෙනඟට ද සැදැහැවතුන්ට ද
එතුමාණන් තුළ විශ්වාසය තබන අයට ද
සමිඳාණෝ සමාදානය දීමට පොරොන්දු වූ සේක.

එතුමන් හට ගරු බිය පාන අයට ගැළවීම ඉතා සමීප ව ඇත්තේ ය.
සත්තට ම එතුමන්ගේ මහිමාලංකාරය අප රටෙහි බබළන්නේ ය.
තිර පෙම සහ විශ්වාසවන්තකම හමු වන්නේ ය.
දැහැමි බව සහ සාමය වැළඳ ගන්නේ ය.

විශ්වාසවන්තකම මිහි තලයෙන් ඉහළට නගින්නේ ය.
දැහැමි බව සගලොවින් පහළට බසින්නේ ය.
සමිඳාණෝ අප සමෘද්ධිමත් කරන සේක.
අපේ දේශය එහි ඵලදාව නිපදවන්නේ ය.
දැහැමි බව එතුමන්ට පෙරටු ව යන්නේ ය.
එතුමන්ගේ පා සළකුණු මාර්ගයක් වන්නේ ය.

## දෙවන දේව ප්‍රකාශනය 2 පේදුරු 3: 8-14

*පේදුරු තුමන් විසින් ලියන ලද දෙවන හසුනෙන් උපටා ගත් කොටසකි.*

අපි නව අහසක් හා නව පොළොවක් බලාපොරොත්තුවෙන් සිටිමු.

එහෙත් ප්‍රේමවන්තයෙනි, “සමිඳාණන් වහන්සේට එක දවසක් අවුරුදු දහසක් මෙන් ය, අවුරුදු දහසක් එක දවසක් මෙන් ය,” යන වැදගත් සත්‍යය අමතක නොකරන්න. පමා වී ඇතැ යි සමහරුන් සිතන නමුත්, සමිඳාණන් වහන්සේ සිය පොරොන්දු ඉටු කිරීමට පමා වී නැත. එහෙත් කිසිවකු විනාශ වීම උන් වහන්සේගේ කැමැත්ත නොවන බැවින්, සියල්ලනට පසුතැවී සිත් හරවා ගැනීම සඳහා අවස්ථාවක් ලැබෙනු පිණිස උන් වහන්සේ ඔබ ගැන බොහො කල් ඉවසන සේක.

එහෙත් සමිඳාණන් වහන්සේගේ දවස සොරෙකු මෙන් හදිසියෙන් පැමිණෙයි. ඒ දවසේ දී අහස ගිගුරුම් හඬ දෙමින් පහ වී යන්නේ ය. මහා භූතයෝ ද ගිනිගෙන උණු වී දැවී යන්නෝ ය: පොළොව ද එහි ඇති සියල්ල ද දැවී විනාශ වී යන්නේ ය. මේ මුළු විශ්වය ම මේ අයුරින් විනාශ වී යන බැවින් ඔබ කොයි ආකාර අය විය යුතු ද?

ඔබ ශුද්ධ හැසිරීමකින් භක්තිවන්ත ලෙස ජීවත් විය යුතු ය. දෙවියන් වහන්සේගේ දවස පැමිණීම බලා සිට එය ඉක්මන් කිරීමට උත්සාහ කරන්න. ඒ දවසේ දී අහස ගිනිගෙන විනාශ වනු ඇත. මහා භූතයන් දැවී උණු වී යනු ඇත. එහෙත් ධර්මිෂ්ඨකමට වාසභූමිය වූ නව අහසක් ද නව පොළොවක් ද දෙවියන් වහන්සේ අපට පොරොන්දු වී ඇත. අපි එය බලාපොරොත්තුවෙන් සිටිමු.

එබැවින්, ප්‍රේමවන්තයෙනි, ඔබ මේ දේවල් බලාපොරොත්තුවෙන් සිටින අතර, උන් වහන්සේ ඉදිරියෙහි නොකැළැල් ව නිදොස් ව සිටින්නට දැඩි උත්සාහයක් ගෙන උන් වහන්සේ සමඟ සමාදානයෙන් සිටින්න.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ලූක් 3: 4, 6

ආලේලූයා! ආලේලූයා!
“සමිඳුන්ගේ මඟ පිළියෙල කරන්න,
එතුමන් හට ඇද නැති මාවත් සාදන්න.
සියලු කඳු හා හෙල් සමතලා කරනු ලැබේ. රළු මාවත් මට්ටම් කරනු ලැබේ. දෙවියන් කෙරෙන් වන විමුත් මඟ මනු සත දකිනු ඇතැ යි පාළුකරයෙහි මොරගා කියන හඬෙකි.”
ආලේලූයා!

## සුවිශේෂය මාක් 1: 1–8

*මාක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### සමිඳාණන් හට ඇද නැති මාවත් සාදන්න.

දේව පුත්‍ර ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ සුබ අස්නේ ආරම්භය මෙය ය. යෙසායා සිය දිවැසාවලියෙහි මෙසේ ලියා ඇත.

“මෙන්න, මාගේ දූතයා ඔබට පෙරටුව යවමි. හෙතෙම ඔබ වඩිනා මඟ පිළියෙළ කරන්නේ ය. ‘සමිඳුන්ගේ මඟ පිළියෙළ කරන්න. එතුමන් හට ඇද නැති මාවත් සාදන්නැ’ යි පාළුකරයෙහි මොරගා කියන හඬක් වේ.”

එපරිද්දෙන් ස්නාවක ජොහන් තෙමේ “පව් කමාව පිණිස පසුතැවී සිත් වෙනස් කරගෙන බව්තීස්ම–ස්නාපනය ලැබිය යුතු ය”යි දේශනා කරමින් පාළුකරයෙහි පහළ විය. එවිට මුළු ජුදා රට ද ජෙරුසලෙම් පුරවැසියෝ ද ඔහු වෙත රැස් වී පාපොච්චාරණය කරමින් ඔහුගෙන් ජොර්දාන් ගඟෙහි බව්තීස්ම–ස්නාපනය ලැබූ හ.

ජොහන් ඔටු ලොම් වස්ත්‍රයක් හැඳ, ඉණ වටා සම් පටියක් බැඳ සිටියේ ය. පළගැටියන් හා වන මී ඔහුගේ ආහාරය විය. ඔහු දේශනා කරමින්, “මට වඩා ආනුභාවසම්පන්න උතුමාණන් කෙනෙක් මට පසුව එති. නැමී එතුමාණන්ගේ පා වහන් පටි මුදන්නට පවා මම නොවටිමි. මම වතුරෙන් ඔබ බව්තීස්ම–ස්නාපනය කෙළෙමි. එහෙත් උන් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් ඔබ බව්තීස්ම–ස්නාපනය කරන සේකැ” යි කීය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*